විශාඛා විද්‍යාලය, කොළඹ 5

මාර්ගගත තක්සේරුකරණය - පළමු වාරය 2021

බුද්ධ ධර්මය

11 ශ්‍රේණිය

කාලය ඃ පැය 1 යි

නම / අංකය ඃ.............................................................................................................................................................

I කොටස

❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) සිතෙහි, කයෙහි නිදිමත ස්වභාවය, උදාසීන කම පවතී නම් කළ දෙය මතකයට නොඑයි. එම ස්වභාවය හැඳින්වෙන නීවරණය කුමක් ද?
1. උද්ධච්ඡ කුක්කුච්ඡ නීවරණය
2. ථීන මිද්ධ නීවරණය
3. ව්‍යාපාද නීවරණය
4. විචිකිච්ඡා නීවරණය (.........)

(2) ප්‍රතිසන්ධිය ලබා දීමට ඉවහල් වන කර්මය වන්නේ,
1. ජනක කර්මය
2. උපපීලක කර්මය
3. උපත්ථම්භක කර්මය
4. උප්ජ කර්මය (.........)

(3) පඤ්ච ස්කන්ධය යනු,
1. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, මනස
2. ඇස, කන, නාසය, දිව, ශරීරය
3. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ
4. රූප, උපාදානය, වේදනා උපාදානය, තණ්හා උපාදානය, සඤ්ඤා උපාදානය, සංඛාර උපාදානය (.........)

(4) ''ඔබ ගාන්ධර්වයෙක් ද?... යක්ෂයෙක් ද?... මනුෂ්‍යයෙක් දැයි පිළිවෙළින් අසන ලද්දේ?
1. සෝණ දණ්ඩ බමුණා
2. චංකි බමුණා
3. සොත්ථිය බමුණා
4. ද්‍රෝණ බමුණා (.........)

(5) ''යේ ධම්මා හේතුප්පභවා'' යන ගාථාව දේශනා කරනු ලැබුවේ කවුරුන් ද?
1. අස්සජි මහරහතන් වහන්සේ
2. මුගලන් රහතන් වහන්සේ
3. මහා කාශ්‍යප හිමි
4. ආනන්ද තෙරුන් (.........)

(6) ආහාර ගැනීමෙන් පසු ඇඳුම් ඇඳ ගැනීමටත් බැරි තරමට ඇඳුම ගැනවත් නොසලකා ආහාර ගන්නා තැනැත්තා
1. කාකමාසක
2. ආහාර හත්ථක
3. භුතථවමිතක
4. අලංසාටකය (.........)

(7) ථේරවාදී ධර්ම සම්ප්‍රදායේ සිව්වැනි ධර්ම සංගායනාව හඳුන්වන ලද විශේෂ නාමය කුමක් ද?

1. පුස්තකාරූඪ සංගායනාව
2. පංචසතිකා සංගීති
3. සප්ත සතිකා සංගීති
4. සාහස්සිකා සංගීති (.........)

(8) ථූපාරාම දාගැබෙහි නිදන් කොට ඇති ධාතූන් වහන්සේ වන්නේ,

1. දකුණු දන්ත ධාතූන් වහන්සේ
2. බුදුන් වහන්සේගේ කේශ ධාතූන් වහන්සේ
3. බුදුන් වහන්සේගේලලාට ධාතූන් වහන්සේ
4. බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ (.........)

(9) පාරමිතා ධර්ම හඳුන්වන වෙනත් නමක් වන්නේ,

1. බෝධි කාරක ධර්මය
2. බුද්ධ කාරක ධර්මය
3. සංඝ කාරක ධර්මය
4. පරමත්ථ පාරමී ධර්ම (.........)

(10) බෝසත් උතුමන් විසින් අධිෂ්ඨාන පාරමිතාව පූරණය කළ ආකාරය පෙන්වා දෙන ජාතකය වන්නේ,

1. කුරු ධර්ම ජාතකය
2. තේමිය ජාතකය
3. වෙස්සසන්තර ජාතකය
4. මඛාදේව ජාතකය (.........)

(11) සමථ භාවනාව සඳහා යොදා ගන්නා කර්මස්ථාන ගණන කීයද?

1. තිහකි.
2. දහයකි.
3. විස්සකි.
4. හතලිහකි. (.........)

(12) රේරුකානේ චන්දවිමල මහ හිමිපාණන් වහන්සේගේ මව සහ පියා වූයේ

1. මල්ලිකා ධර්ම ගුණවර්ධන / කලෝරලිස් හේවාවිතාරණ
2. මුණසිංහගේ පොඩි නෝනා / පවුලිස් ගුණවර්ධන මහතා
3. පුංචි මැණිකේ මාතාව / උස්වත්තගේ මද්දුහාමි
4. ඩිංගිරිහාමි මාතාව / දොන් සීමන් ගුණවර්ධන මහතා (.........)

(13) සමථ භාවනාවෙන් ලැබෙන උසස්ම ප්‍රතිඵලයන් දෙක වන්නේ,

1. පංච අභිඥා සහ සප්ත සමාපත්ති
2. සෝවාන් සහ සකෘදාගාමී මාර්ගයන්
3. සප්ත සමාපත්ති සහ සෝවාන් ඵලය
4. පංච අභිඥා සහ අෂ්ට සමාපත්ති (.........)

(14) ''ස්වාමීනි අප පස්කම් සුව අනුභව කරමින් අඹු දරුවන් නිසා වන කරදර සහිතව ගිහි ගෙදර වාසය කරමු'' යනුවෙන් පවසන ලද්දේ,

1. කාලාම සිටු පුත්‍රයා
2. දීඝජානුකෝලිය.
3. උදේනි සිටු පුත්‍රයා
4. අනේපිඬු සිටුතුමා (.........)

(15) රේරුකානේ චන්ද විමල නාහිමිපාණන් විසින් රචිත පළමු ග්‍රන්ථය වන්නේ,

1. නිර්වාණ විනිශ්චය
2. මුණිගුණාලංකාරය
3. දහම් සරණ
4. බෞද්ධයාගේ අත්පොත (.........)

(16) සීල ශික්ෂාවට අයත් අංග සඳහන් නිවැර දිපිළිතුර තෝරන්න.

1. සම්මා දිට්ඨි, සම්මා වාචා, සම්මා ආජීව
2. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව
3. සම්මා වාචා, සම්මා සති, සම්මා ආජීව
4. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා (.........)

(17) අනගාරික ධර්මපාලතුමා උපත ලද වර්ෂය මාසය දිනය වන්නේ,

1. 1798/09/18
2. 1874/09/17
3. 1864/09/17
4. 1875/09/19 (.........)

(18) ධම්ම පදයේ සඳහන් ගාථා ගණන හා වග්ග ගණන කීයද?

1. 423 සහ 26
2. 424 සහ 28
3. 423 සහ 27
4. 432 සහ 26 (.........)

(19) ''අක්කොච්ජිමං අවධි මං'' යන ධම්ම පද ගාථාව ඇතුළත් වග්ගය වන්නේ,

1. බාල වග්ගය
2. පට්ඨාන වග්ගය
3. ජරා වග්ගය
4. යමක වග්ගය (.........)

(20) යමක් කිරීමෙන් පසුතැවිලි වන්නට සිදුවේද? යමක විපාකය කඳුළු පිරි මුහුණින් යුතුව විඳින්නට සිදුවේ ද? යන්න සඳහන් ධම්ම පද ගාථාවේ මුල් පදය

1. තංච කම්මං කතං සාධූ
2. නතං කම්මං කතං සාධූ
3. අත්තනාව කතං පාපා
4. සූකරාගී අසාධූනී (.........)

(21) අඩු ආදායමක් ඇතිව වැඩියෙන් වියදම් කරන්නා බුදු දහමෙහි හඳුන්වා ඇත්තේ,

1. උදුම්බරබාදික ලෙසයි.
2. අත්ථක්ඛායි ලෙසයි.
3. තුලාධාරික ලෙසයි.
4. සමජීවිකතා ලෙසයි. (.........)

(22) තිරිසනුන්ට හා පක්ෂීන්ට ධාර්මික රැකවරණය සලස්වන්න යැයි සඳහන් වන්නේ,

1. දස රාජ ධර්මවලය
2. සප්ත අපරිහානී ධර්මවලය
3. දස සක්විති වත්වලය
4. දස පින් කිරියාවත් වලය (.........)

(23) මහා මංගල සූත්‍රය දේශනා කරන ලද්දේ

1. එක්තරා බමුණෙක් හටය.
2. එක්තරා පරිබ්‍රාජකයෙකුට ය.
3. එක්තරා දෙවියෙක්ට ය.
4. එක්තරා මසුරු  බමුණෙක් හටය. (.........)

(24) ''උට්ඨානවතෝ සතිමතෝ'' යන ධම්ම පද ගාථාවව ඇතුළත් වන්නේ ,

1. අත්ත වග්ගයටය.
2. ජරා වග්ගයටය.
3. යමක වග්ගයටය.
4. අප්පමාද වග්ගයටය. (.........)

(25) අනගාරික ධර්මපාලතුමා ලෝකයො හඬවමින් මෙලොවින් සමුගන්නා ලද්දේ,

1. 1933 අප්‍රේල් 18
2. 1933 මැයි 29
3. 1933 අප්‍රේල් මස 29
4. 1933 සැප්තැම්බර් 29 (.........)

(26) වේරුකානේ චන්ද විමල නාහිමිපාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථයකි.

1. බුද්ධ චරිතය
2. පාලි බෝධි වංශය
3. මුණිගුණාලංකාරය.
4. අභි ධර්ම මාර්ගය (.........)

(27) නෙක්ඛම්ම පාරමිතාව අප බෝසත් උතුමන් පූරණය කළ ආකාරය කියවෙන ජාතකයක් වන්නේ,

1. මඛාදේව ජාතකය
2. නළපාන ජාතකය
3. පුප්පගාන්ධ ජාතකය
4. සුතසෝම ජාතකය (.........)

(28) විශේෂ පුද්ගලයෙක හෝ පිරිසක් අරබයා බුදුන් වහන්සේ පිහිට වීමට වැඩම කිරීම හැඳින්වෙන්නේ

1. අතුරිත චාරික
2. නිබඳ චාරික
3. තුරිත චාරික
4. මග්ගා මග්ග චාරික (.........)

(29) ''බාහියදාරුචිය'' යනු,

1. බමුණෙකි
2. රහතන් වහන්සේ නමකි.
3. දිව්‍ය පුත්‍රයෙකි
4. අසරණ පුද්ගලයෙකි. (.........)

(30) තම ශරීර අවයව දන් දී හෝ පාරමිතා පුරණය කිරීම හැඳින්වෙන්නේ,

1. පාරමී  ලෙසටය.
2. උපපාරමී
3. පරමත්ථ පාරමී ද
4. මේ සියල්ලට ම අයිතිය. (.........)

(31) ''දිවා රෑ දෙකෙහිම භාවනාවට යොමු කළ සිත් ඇති බුදු සව්වෝ නිරතුරු ගතකරනුයේ,

1. ප්‍රසිද්ධ ජීවිතයකි.
2. ප්‍රබුද්ධ ජීවිතයකි.
3. නිදහස් ජීවිතයකි.
4. නිසංසල ජීවිතයකි. (.........)

(32) අටුවා ග්‍රන්ථ තඹ පත්තිරුවල ලියවා සෙල්මුවා මංජුසාවල බහා ස්ථූපයක තැන්පත් කිරීම සිදුවූයේ,

1. පුස්ථාකාරූඪ සංගායනාවේදී ය.
2. දෙවන සංගායනාවේදී ය.
3. තුන්වන සංගායනාවේදී ය.
4. කනිෂ්ක සංගායනාවේදී ය. (.........)

(33) ''ථූපාරාම'' දාගැබ නිර්මාණය කරන ලද්දේ?

1. පළමුවන පරාක්‍රමබාහු රජු
2. දෙවන පෑතිස් රජු
3. දුටුගැමුණු රජු
4. පණ්ඩුකාභය රජු (.........)

(34) තමා නිරෝගීව සිටි කාලයේ රෝගී වූ භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කිරීමට කිසි දිනෙක සම්බන්ධ නොවීම නිසා තමනට මෙම තත්ත්වය උදා වූ බව පවසන ලද්දේ,

1. පූතිගත්ත තිස්ස හිමි
2. පුණ්ණ හිමි
3. උදරාබාධයෙන් පෙළුණු හිමි
4. සුභද්‍ර හිමි (.........)

(35) කලාත්මක බවින් අනූන බෝධිසරය පිහිටා ඇත්තේ,

1. බිසෝ මාලිගය අසළ
2. මැදිරිගිරියේ ය.
3. නිල්ලක්ගමය
4. නිශ්ශංඛ ලතා මණ්ඩපයේ ය. (.........)

(36) ''සීගිරිය'' ''හිඳගල'' යන ස්ථානවල ඇති චිත්‍ර අයත් වන්නේ කුමන යුගයට ද?

1. කෝට්ටේ යුගය
2. අනුරාධපුර යුගය
3. මහනුවර යුගය
4. පොළොන්නරු යුගය (.........)

(37) බුදුන් වහන්සේ ඇතුළු ශ්‍රාවකයන් වහන්සේලාට ඉතා කටුක ආහාර පාන වළඳමින් දුෂ්කර ජීවිතයක් ගත කිරීමට සිදු වූ වස් කාලය වන්නේ,

1. දහවන වස් කාලය
2. දාසය වන වස් කාලය
3. පස්වන වස් කාලය
4. දොළොස්වන වස් කාලය (.........)

(38) අනුන්ගේ යහපත දියුණුව පිණිස කටයුතු කිරීම හඳුන්වන්නේ,

1. පරාර්ථකාමී බවයි.
2. මෛත්‍රියයි.
3. සමානාත්මතාවයි.
4. අර්ථචර්යාවයි. (.........)

(39) දෙවන ධමර් සංගායනාව සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළේ,

1. සබ්බකාමී රහතන් වහන්සේ
2. මහා කාශ්‍යප රහතන් වහන්සේ
3. කාකණ්ඩපුත්ත යස රහතන් වහන්සේ
4. වාසභගාමී සුමන රහතන් වහන්සේ (.........)

(40) විභව තණ්හා ලෙස හැඳින්වෙන්නේ,

1. දිගින් දිගටම මෙළොව වශයෙන් සැප විඳීම.
2. පරලොවක් නැත යන විශ්වාසය
3. පින් පව් නැත යන විශ්වාසය.
4. පව් කමා කළ හැකි යැයි යන විශ්වාසය. (.........)

විශාඛා විද්‍යාලය, කොළඹ 5

මාර්ගගත තක්සේරුකරණය - පළමු වාරය 2021

බුද්ධ ධර්මය II

11 ශ්‍රේණිය

කාලය ඃ පැය 2 යි

නම / අංකය ඃ.......................................................................................................................

## I කොටස

❖ **පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(1)

(i) සේඛියා ධර්මවලට අනුව ආහාර පරිභෝජනයේදී පිළිපැදිය යුතු යහපත් පුරුදු දෙකක් ලියන්න.

(ii) සිදුහත් බෝසතාණෝ බුදු වීමෙන් පසු කළ ප්‍රථම උදාන වාක්‍යයේ පේළි දෙකක් ලියන්න.

(iii) අනේපිඬු සිටුතුමා සහ විශාඛා සිටු දේවිය විසින් පූජා කළ ආරාම දෙක ලියන්න.

(iv) කර්මය සහ විපාක පිළිබඳ සඳහන් සූත්‍ර දෙකක් ලියන්න.

(v) දම්සක් පැවතුම් සූත්‍රය තුළ අන්තර්ගත වන්නේ කුමක් ද?

(vi) බුදුන් වහන්සේගේ දින චර්යාව තුළ 'මැදියම් කිස' තුළදී උන්වහන්සේ ක්‍රියා කරන ලද්දේ කෙසේ ද?

(vii) පසේ බුදු බව පතන උත්තමයෙකු පිරිය යුතු පාරමිතා ප්‍රධාන වශයෙන් මොනවා ද?

(viii) 'කුසල්' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(ix) සීලය පිළිබඳ සඳහන් සංකල්ප දෙකක් නම් කරන්න.

(x) 'දිළිඳුකම' හේතු කොට ගෙන සමාජීය ගැටළු ඇතිවන ආකාරය සඳහන් සූත්‍රය කුමක් ද?

(2) (i) ස්තූප ස්වරූපය අනුව වවිධ හැඩයන්ගෙන් යුක්තය. ඉන් දෙකක් සඳහන් කරන්න. **(ලකුණු 02)**

(ii) රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවන යන දාගැබ් නිර්මාණය කළ රජවරු පිළිවෙළින් ලියන්න. **(ලකුණු 03)**

(iii) ස්ථූප කලාව පිළිබඳව හඳුන්වා දෙමින් එහි කොටස් ඇඳ නම් කරන්න. **(ලකුණු 05)**

(3) (i) බුදුන් වහන්සේ විසින් සප්ත අපරිහානී ධර්ම දේශනා කරන ලද්දේ කාහට ද? **(ලකුණු 02)**

(ii) සප්ත අපරිහානී ධර්මවල අඩංගු කරුණු තුනක් ලියන්න. **(ලකුණු 03)**

(iii) යහපත් රාජ්‍ය පාලකයෙකු විසින් රට වැසියන්ගේ යහපත සඳහා අනුගමනය කළයුතු ආචාර ධර්ම පිළිබඳ විස්තර කරන්න. **(ලකුණු 05)**

(4) (i) විපාක දෙන ආකාරය අනුව කර්මය ආකාර හතරකි. ඉන් දෙකක් සඳහන් කරන්න. **(ලකුණු 02)**

(ii) දූරංගමං ඒකචරං අසරීරං ගුහාසයං යන ගාථාවේ ඉතිරි පේළි දෙක සම්පූර්ණ කරන්න. **(ලකුණු 03)**

(iii) විදර්ශනා භාවනාව පිළිබඳ හඳුන්වා ඒ තුළින් ලෝකෝත්තර සැප ලැබීම පිණිස හේතුවන ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 05)**

(5) (i) ධර්ම සංගායනාවක් යනු කුමක් දැයි කෙටියෙන් ලියන්න. **(ලකුණු** 02)

(ii) කනිෂ්ක ධර්ම සංගායනාවෙන් ලැබුණු ප්‍රතිඵලයන් තුනක් සඳහන් කරන්න. **(ලකුණු** 03)

(iii) ථේරවාදී බෞද්ධ සම්ප්‍රදාය තුළ සිදුකළ සංගායනා තුළින් ශාසනයේ සුරක්ෂිත භාවය වඩාත් තහවුරු විය. විමසන්න. **(ලකුණු** 05)

(6) (i) පාරමිතා යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු** 02)

(ii) පාරමිතාවක් ත්‍රිවිධාකාර වන ආකාරය පෙන්වා දෙන්න. **(ලකුණු** 03)

(iii) සදාචාරාත්මක සමාජයකට පාරමිතා ධර්ම වටිනා මඟ පෙන්වීමක් සිදු කරයි. විමසන්න. **(ලකුණු** 05)

(7) පහත මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) රේරුකානෙ චන්ද විමල නාහිමි.

(ii) සඳකඩ පහණ

(iii) සිඟාලෝවාද සූත්‍රය

(iv) වැලිවිට සරණංකර සංඝරාජ නාහිමි **(ලකුණු 2×5=10)**